කෑගල්ල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 25 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස්දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ 2019 වර්ෂයේ මිළදී ගන්නා ලද රු.1,450,000 ක් වූ ගල් රෝල වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය රු. 2,033,000 ක් වෙන් කිරීම නිසා රු. 583,000 කින් ණයහිමි ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2018 වර්ෂයේ නව ගල් රෝලක් මිලට ගැනීමට රු.2,033,000 ක පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ප්‍රතිපාදන සලසා ගෙන ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත රු.1,450,000 ක් වටිනා ගල් රෝලක් 2019 වසරේ ණයහිමි ප්‍රතිපාදන යටතේ මිල දී ගැනීම සිදු විය. එම නිසා මෙහිදී ඇති වූ රු.583,000 ක අධි වෙන් කිරීම 2019 වර්ෂයේ අවසන් ගිණුම සෑදීමේ දී සමුච්චිත අරමුදලට කපා හැරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුවේ. | 2018 වර්ෂය සඳහා විගණන ගාස්තු අතපසු වීමකින් ණයහිමි ප්‍රතිපාදන යටතේ දක්වා නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදල හරහා ගෙවීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 07 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු.5,228,843 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කඩිනමින් මේ සම්බන්ධ පරීක්ෂා කර නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) ඉඩම්, ගොඩනැගිලි, වාහන, කාර්යාලීය උපකරණ, පොත් පත් හා තොග ඇතුළු වත්කම් වල වටිනාකම රු. 165,995,470 ක් වුවද භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වටිනාකම රු.167,197,521 ක් වූයෙන් රු.1,202,051 ක වෙනසක් විය. | සැසඳීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉඩම් ගොඩනැගිලි හා වාහනවල වටිනා ස්ථාවර වත්කම් ලේඛනය සමඟ ස කර ඇත. මෙම වෙනස පවතින් කාර්යාල උපකරණ ගිණුමේ බව අප උපකල්පනය කරන බැවින කාර්යාල උපකරණ පිළිබඳ සමීක්ෂණය කර නිවැරදි කර ගැනීමට කටයුතු කරමි බව |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාලයක් ඉක්ම වූ කර්මාන්ත ණයගැති ශේෂය රු. 2,250,646 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් සභා විමධ්‍යගත සහ වෙනත් මූල්‍ය ප්‍රභවයන් යටතේ වැඩ අවසන් වන කර්මාන්තවල 10% රඳවුම් ගෙවීමට මාස 3ක නඩත්තු කාලයක් තිබේ. සමහර කර්මාන්ත එළඹෙන වසර දක්වා ඉදිරියට යනු ලැබේ. මෙම තත්ත්වය හේතු කොටගෙන වර්ෂයක කාලය ඉක්ම වූ ණයගැති සහ ණයහිමි ශේෂ ඇතිවේ. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාලයක් ඉක්මවා තිබුණු ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 3,810,292 ක් | ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණයහිමි යටතේ ගෙවීමට ඇති විශ්‍රාම වැටුප් දායක මුදල පසුගිය වසර ගණනක සිට ගෙවීම සඳහා වෙන් වූවකි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ගෙන්වා ගෙන ඉදිරියේ දී නිදහස් කිරීමට කටයුතු කරමි. 2018 දෙසැම්බර් 31 දිනට පවතින කර්මාන්ත තැන්පත් හා විවිධ තැන්පත් සඳහා වර්ෂ 2 ක |

| | |
|---|---|
| විය. | කාලයක් ඉක්ම වී ගොස් නොමැති බැවින්, ඉදිරියේ දී මෙම තැන්පත් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

**1.4** අනුකූල නොවීම

**1.4.1** නීති, රීති, රෙගුලාසි හා කලමණාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158(1)(අ) වගන්තිය | 492,399 | වර්ෂයකට වැඩි කාලයක් පවතින හිඟ වරිපනම් බදු හා අක්කර බදු සම්බන්ධයෙන් පනත ප්‍රකාරව අයිතිකරුගේ දේපල තහනමට ගෙන හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම වර්ෂයේ සිට කාර්තු 02 කට අධික හිඟ පවතින සියලුම දේපල සම්බන්ධ රතු නිවේදන යැවීමට කටයුතු කර ඇත. දේපල තහනම් කිරීම් 2018 වර්ෂයේ සිදු කොට ඇති අතර, මුලු හිඟයෙන් 76% ක් 2018 දෙසැම්බර් 31 දින වන විට අය කර ඇත. ඉතිරි හිඟ මුදල් අය කිරිම සඳහා ජංගම සේවා සහ දේපල තහනම් කිරිමේ කටයුතු අඛන්ඩව සිදු කිරීමට කටයුතු කරමි. ඒ අනුව 2019 වර්ෂයේදී හිමිකරුවන් සොයා ගැනිමට අපහසු දේපල සම්බන්ධයෙන්ද නීතිමය කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 571 (ii) හා (iii) | 232,231 | 2015 වර්ෂයේ තැන්පත් කල විශ්‍රාම වැටුප් දායක මුදල් හා කර්මාන්ත තැන්පත් 9 ක් සම්බන්යෙන් කටයුතු කර නොතිබුණි. | . මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | මු.රෙ. 571 ප්‍රකාරව වසර 02 ක් ඉක්ම යාමට පෙර මෙම කර්මාන්ත තැන්පත් නිදහස් කර ඇතත් ඒවා වෙනත් වැය ශීර්ෂ හරහා නිදහස් වී ඇත. එම තැන්පතු 2019 වසරේ ජ'නල් මඟින් වැරදි නිවැරදි කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 1645 (ආ),(ඇ) | වාහන 7 ක මාසික ධාවන සටහන් මාස 5 සිට වර්ෂ 6 දක්වා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | 2017 වසරේ සිට මේ දක්වා යම් යම් කාල සීමාවන්ට අදාළව ප්‍රමාදයන් ඇතත්, වසර 6කට පැරණි ප්‍රමාදයන් දක්නට නොමැත. කෙසේ නමුත් ප්‍රමාද වූ ධාවන සටහන් සකසමින් පවතින අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවේ වාහන 7 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | සභාව සතු රථ වාහන අතරින් ඉන්ධන පරීක්ෂාව සිදු කර නොමැති වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට සභාවේ කාර්මික නිලධාරීන්ට වගකීම පවරා ඇති අතර, පෙන්වා දී ඇති වාහන 09 න් ඉන්ධන පරීක්ෂාව සඳහා වසරක කාලය ඉක්ම නොගිය වාහනද ඇති අතර මේ වන විට ඉන්ධන පරීක්ෂාව සිදු කල වාහන 03ක් ඇත. ඒ අනුව ඉතිරිව පවතින ට්‍රැක්ටර් රථ සඳහා කඩිනමින් ඉන්ධන පරීක්ෂා කටයුතු සිදු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 29,303,136 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත්වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 22,300,233 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු | රැස්කළ ආදායම රු | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු |
| i | වරිපනම් හා බදු | 3,257,700.00 | 3,126,223.88 | 2,317,130.67 | 998,819.21 | 3,047,340.00 | 3,112,442.89 | 2,407,029.81 | 1,279,906.04 |
| ii | කුලී | 128,000.00 | 106,000.00 | 120,360.00 | 96,341.31 | 100,800.00 | 172,165.00 | 130,250.00 | 94,151.31 |
| iii | බලපත්‍ර ගාස්තු | 600,000.00 | 615,000.00 | 615,000.00 | - | 665,000.00 | 671,734.38 | 671,734.38 | - |
| iv | වෙනත් ආදායම් | 57,330,000.00 | 74,140,516.28 | 33,390,656.83 | 39,735,669.69 | 52,700,000.00 | 53,716,495.92 | 29,776,896.09 | 42,094,815.83 |

### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2008 වර්ෂයේ තක්සේරුවකට අනුව 2009 වර්ෂයේදී කුලියටදී තිබූ මොරොන්තොට වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල හිඟ කඩ කුලී ශේෂය රු. 95,989 ක් විය. නව තක්සේරුවක් කර වර්තමාන වටිනාකමට කඩ කුලී අය කිරීමටද කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පැරණි වෙළඳ සංකීර්ණය ඉවත් කර නව වෙළඳ සංකීර්ණයක් ඉදිවෙමින් පවතින අතර එම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර මේ වන විට නව වෙළඳ පල තක්සේරු වටිනාකම මත ටෙන්ඩර් පටිපාටියට යටත්ව මෙම වසර තුල වෙළඳ ප්‍රජාවට ලබා දීමට යෝජිතය. අංක 07 කඩ කාමරයේ බදුකරු පූර්ණ ආබාධිත තත්වයට පත්ව ඇති අතර කිසිදු ආදායම් මාර්ගයක් නොමැතිව රජය මගින් ලබා දෙන සහනාධාරයක් මත ජීවිකාව ගෙනයනු ලැබේ. එමනිසා මෙම හිඟ මුදල අයකර ගැනීමට අපහසු බව පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර ඉදිරි කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 12,572,617 ක් හා මුද්දර ගාස්තු රු. 24,116,392 ක් විය. | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදලින් රු. 8,050,684 ක් ද ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,131,099 ක් 2019 වර්ෂයේ ලැබී ඇති අතර ඉතිරි මුදල් ද පළාත් සභාවෙන් ගෙන්වා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. |

2.2.4 වෙනත් ආදායම්

-----------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ගාස්තු වශයෙන් රු. 56,781 ක් අය විය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් අය කර ගැනීම දැඩි දුෂ්කරතාවක්ව පවති. මෙම හේතුවෙන් වාර්ෂිකව ඉදිරියේදි ගැලපෙන ලෙස අතුරු ව්‍යවස්ථා සකස් කර මෙම තත්වය මඟ හරවා ගැනිමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස්ක් දැක්වීම |
| --- | --- | --- |
| සම්මත අතුරු ව්‍යවස්ථා 42 ක් පිළිගෙන තිබුණ ද ප්‍රචාරක දැන්වීම් පල කිරීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සම්මත කරගත් අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කළයුතුවේ. | අතුරු ව්‍යවස්ථා අනුව ප්‍රචාරක දැන්වීම් ගාස්තු අය කිරිමේදි දැනට කොටසක් ක්‍රියාත්මක වන අතර, ප්‍රායෝගික නොවන සමහර කොන්දේසි මඟ හැරී ඇත. නමුත් ඉදිරියේදි සභා තීරණයක් මත සභාවට ගැලපෙන අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරිමට අදාළ කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| අයවැය ලේඛනය අනුව මාර්ග 53 ක් | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක | 2018 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද අයවැය ලේඛනයේ |

| | | |
|---|---|---|
| අලුත්වැඩියා කිරීම ඇතුළු තවත් ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 5.1 ක් වෙන්කර එයින් ව්‍යාපෘති 5 ක් පමණක් නිමකර තිබුණි. ඉතිරි මුදලින් නව වෙනත් ව්‍යාපෘති 44 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ව්‍යාපෘති 22 ක් පමණක් නිමකර තිබුණි. | කිරීමට කටයුතු කළ යුතුවේ. | නිලධාරි මට්ටමේ සකස් කරන ලද අයවැය ලේඛනයකි. නමුත් 2018 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට නව සභාව පත්වීම හේතුවෙන් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට සිදු විය. |

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් කසල කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම නිසා කසල මගින් ආදායම් උත්පාදනය කිරීම සිදුකර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | දිරන කසල කළමනාකරණය කිරීම සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් ලබා දීමට නාථ දේවාලයේ බස්නායක නිලමේතුමා වාචිකව කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඒ සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය කර ගන්නා ලදී. මේ අනුව කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා ඉඩමක් ලබාගැනීමේ මූලික අදියර කිහිපයක් සිදු කර ඇත. |

(ඇ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සභාව සතුව සුදුසු ඉඩමක් නොමැති බැවින් ඉඩ පහසුකම් ඇති අයට පමණක් ගලි සේවාව සපයා තිබුණි. | බල ප්‍රදේශයේ මහජනයාට පහසුකම් සැලසීම සඳහා ක්‍රියා කළ යුතුවේ. | දැනට සභාව සතුව සුදුසු ඉඩමක් නොමැති බැවින් ගලි අපද්‍රව්‍ය ඉවතලීමේදී ජනතාවට සුදුසු භූමියක් සකසා ගන්නා ලෙස උපදෙස් දී ඇත. ඉඩමක් ලබාගැනීමෙන් පසු ගලි අපද්‍රව්‍ය පිරිපහදු පද්ධතියක් සකස් කිරීමට සැලසුම් කර ඇති අතර ඉන්පසු නාගරික ජනතාවට එම පහසුකම් ලබා ගැනීමට අවස්ථාව උදාවන බව කාරුණිකව වාර්තා කරමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක.

------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 වර්ෂයේ න්‍යාය පත්‍රය පිලිබඳව සභාව දැනුවත් වී තිබුණද, එම අරමුණු ඉටු කර ගැනීම සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2019 පෙබරවාරි වන විටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක පදනම් කර ගෙන දිගුකාලීන සැලැස්මක් සභාව විසින් සකස් කර නොමැත. මේ සම්බන්ධ විශේෂ අවධානය යොමු කර ඇති අතර සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය සෞඛ්‍ය නංවාලිම සඳහා වන දිගු කාලීන සැලැස්ම සකස් කිරිමට ඉදිරියේදි කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

3. 2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තනතුරු වර්ග 5 කට අදාලව සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 08 ක් පැවතුණු අතර අනුමත කාර්යය මණ්ඩලයට අයත් නොවන ආයුර්වේද වෛද්‍ය නිලධාරියෙකු හා සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු සේවයට බඳවා ගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | කැගල්ල ප්‍රාදේශීය සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ, දරන්නාට පෞද්ගලික වනසේ අනුමත තනතුරු 05 ද ඇතුලත්ව අනුමත කාර්ය මණ්ඩලය 80ක් වේ. ඒ අනුව සිටින සංඛ්‍යාව 71 ක් වන අතර ඊට අමතරව අනියම් පදනමින් 05 ක් හා සේවා ගිවිසුම් මත 01 ක් ද වේ. |

3.3 වත්කම් කළමනාකරණය

------------------------------

3.3.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් නොලැබීම

--------------------------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු මොරොන්තොට ඉඩමෙන් පර්චස් 05 ක් 2011 තක්සේරුව වූ රු. 10,000 ක වාර්ෂික බදු කුලියකට 2012 වර්ෂයේ සිට වර්ෂ 05 ක කාලයක් සඳහා විදුලි බල මණ්ඩලයට බදු දී තිබුණද බදු ගිවිසුම් ප්‍රකාර 2016 හා 2017 වර්ෂ සඳහා බදු මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව බදු කාලය අවසානයේ නැවත බදු දීමේදී නව තක්සේරුවක්මත බදු දියයුතු වුවද, | විධිමත් ගිවිසුම්වලට එළඹ ආදායම් රැස් කර ගැනීමට ක්‍රියා කළ යුතුවේ. | රු. 10,000 ක වාර්ෂික බදු කුලියකට සභාව සතු මොරොන්තොට ඉඩමෙන් පර්චස් 5 ක් 2012 ජනවාරි 18 දින සිට වර්ෂ 05 ක කාලයකට විදුලි බල මණ්ඩලයට බදු දි ඇති නමුත් බදු මුදල් අය වීමේ හිඟ පවතී. නව තක්සේරු වාර්තාව ලද විගස ගිවිසුම් ගත කාලය දීර්ඝ කිරිමට කටයුතු කරන අතර හිඟ මුදල් අය කර ගැනිමට කටයුතු කරමි. |

සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි.

3.3.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ ඉඩම් කට්ටි කිරීමේ දී පොදු කටයුතු සඳහා සභාවට ලැබී තිබුණු අක්කර 01 පර්චස් 26.2 ක් වල් බිහි වී තිබූ අතර මායිම් කණු යොදා ඉඩම ආරක්ෂා කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීමට අවධානය යොමු කර නොතිබුණි. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට සෑම කොට්ඨාශයකටම මන්ත්‍රීවරයෙක් පත්ව ඇති බැවින්, අදාල කොට්ඨාශභාර නිලධාරීන්, සහ මන්ත්‍රීවරයන් සමඟ සම්බන්ධව සභාව සතු දේපල හඳුනාගෙන පවතින ගැටළු නිරාකරණය කර එහි නීත්‍යානුකූල භාවය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර ගෙන යනු ලැබේ. සුසාන භූමි ඇතුළු වත්කම් පිළිබඳ සභා තීරණ අංක 19/05/ඉ-26 යටතේ ස්ථාවර වත්කම් පරීක්ෂක කමිටුවක් පත්කර ඇත. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් සුසාන භූමි 14 ක පැවැත්ම තහවුරු කර ගැනීම පිණිස සුසානභූමි වටා වැටවල් යොදා සුරක්ෂිත කිරීමට පියවර ගෙන නොතිබුණි. | වැටවල් යොදා ඉඩම්වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට පියවර ගත යුතුවේ. | ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් හඳුනා ගත් සුසාන භූමි සම්බන්ධයෙන් මේ වන විට එම සුසානභූමිය වටා වැටවල් යොදා සුරක්ෂිත කිරීමට පියවර ගෙන මූලික අදියරේ කටයුතු අවසන් කර ඇත. මේ සම්බන්ධයෙන් 2019 වර්ෂයේ අයවැය ප්‍රතිපාදනද වෙන් කර ඇත. |

3.3.3 නිශ්කාර්ය වත්කම්

3.3.4 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2011- 2015 අතර කාලවලදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් සහ සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබුණු පිළිවෙලින් රු. 35,643,361 ක් වටිනා වාහන 5 ක් හා රු. 6,096,000 ක් වටිනා ට්‍රැක්ටර් 3 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව වෙත පවරා නොගත් වාහන පවරා දෙන මෙන් පළාත් පාලන අමාත්‍යාංශයෙන් හා සබරගමුව පළාත් සභාවෙන් ඉල්ලීම් කර ඇත. |

3.3.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2013 වර්ෂයේ සිට ධාවන තත්ත්වයේ නොපවතින රු. 625,000 ක් වටිනා ඩබල් කැබ් රථය, රු.346,878 ක් වන ට්‍රැක්ටරය හා රු.79,250 ක් වටිනා ටේලරය අලුත්වැඩියා කර පාවිච්චියට ගැනිමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වාහන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු 53 – 5642 අංක දරන ඩබල් කැබ් රථය යුධ හමුදාව විසින් රැගෙන ගොස් නැවත රැගෙන එන විට කිසිඳු ලිපි ගොනුවක් සභාව වෙත භාර දී නොමැත. 49-7101 අංක දරන ට්‍රැක්ටර් රථය වෙන්දේසි කිරීම සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කෑගල්ල ඩිපෝ ඉංජිනේරු වෙත ඉදිරිපත් කර ඇත. 67 – 0128 අංක දරන ට්‍රැක්ටර් ට්‍රේලරය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. |

3.4 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකර රු.8,625,529 ක ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුවේ. | අතපසු වීමකින් මෙම වැරැද්ද සිදු වී ඇති අතර 2019 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි |

4 ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | 2018 වර්ෂයේ අවසන් කාර්තුවේ කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි වුව ද, 2019 පළමු කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2019 මාර්තු 22 දින පැවැත් වූ බව කාරුණිකව දන්වා සිටිමි. |